ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි මස 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි මස 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.
මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් යටතේ කෙරීගෙන යන වැඩ ලෙස රු.4,832,668 ක් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ඒමේ දී රු.3,000,000 ක් ලෙස දක්වා තිබීමෙන් රු.1,832,668ක වෙනසක් නිරීක්ෂණය විය.	2023 මූල්‍ය ප්‍රකාශන අනුව මූල්‍ය නොවන වත්කම් යටතේ කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබූ රු. 4,832,668න් 2024 වර්ෂය තුළ පිරිමි වැසිකිළි පද්ධතිය සම්පූර්ණ වීම හේතුවෙන් රු. 1,832,668ක් ප්‍රාග්ධනිත කරන ලද බවත් රු. 1,832,668 ගොඩනැගිලිවල වටිනාකමට එකතු වී ඇති බවත් කෙරීගෙන යන වැඩවල වර්තමාන ශේෂය රු. 3,000,000 බව.	ඉකුත් වර්ෂයේ අවසන් ශේෂය ප්‍රවර්ථන වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන නිවැරදිව ගැළපීම සිදු කළ යුතුය.
(ii)	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ රු.4,000,000ක වටිනාකමින් යුතු GB -4052 හා GB-4219 යන මෝටර් රථ දෙක 2024 ජූලි 31 දිනැති අංක POST/OP/CO/IMT/965/2024 දරන තැපැල්පතිගේ ලිපිය මගින් නීත්‍යානුකූලව තැපැල් දෙපාර්තමේන්තුවට පවරා ගත් බව දක්වා තිබූ අතර මෝටර් වාහන ලියාපදිංචි කිරීමේ සහතික අනුවද අයිතිය තැපැල් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති බව සනාථ වූ නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල මෙම වාහනවල වටිනාකම ඇතුළත් කර තිබුණි. නීත්‍යානුකූල අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවන වාහන දෙකක් දෙපාර්තමේන්තුවේ මූල්‍ය නොවන වත්කම් යටතේ දැක්වීම හේතුවෙන් මූල්‍ය නොවන වත්කම්හි අගය එම වටිනාකමින් ඉහළ ගොස් තිබුණි.	2025 වර්ෂය තුළ මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගෙන එම වාහන දෙක වත්කම් ලේඛනවලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බව.	අදාළ ඌණතා සම්බන්ධව කටයුතු කළ යුතු ආකාරය කඩිනමින් තීරණය කර අදාළ වාහනවල වටිනාකම ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**ඇප ලේඛනය**		
	මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.	අදාළ නිලධාරින්ගෙන් ඇප අය කරගත් පසු යාවත්කාලීන කරනු ලබන බව.	මුදල් රෙගුලාසි 891(1) සඳහන් තොරතුරු ඇතුළත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුය.
(ii)	**හානි පිළිබඳ ලේඛනය**		
	මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනයක් යාවත්කාලින කර නොතිබුණි.	යාවත්කාලීන කිරීමට සටහන් කර ගත් බව.	මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගත යුතුය.
(iii)	**බැරකම් පිළිබඳ ලේඛනය** මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් යාවත්කාලින කර නොතිබුණි.	යාවත්කාලීන කිරීමට සටහන් කර ගත් බව.	මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය.
(iv)	**වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය**		
	මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක් පවත්වා නොතිබුණි.	2025 වසරේ සිට ආරම්භ කර පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාර වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(i) විගණනය වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පහත සඳහන් විගණන නිරීක්ෂණ අනුව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ අනුරූපී වී නොතිබුණි.

විගණන නිරීක්ෂණය	මෙම වාර්තාවේ ඡේදයට යොමුව
මූල්‍ය නොවන වත්කම්වලට අදාළව 2023 වර්ෂයේ අවසාන ශේෂය හා 2024 වර්ෂයේ ආරම්භක ශේෂ නොගැළපුණි.	1.6 (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව සඳහා රු.183,300,000 ක මූලධන වියදම් සඳහා ශුද්ධ මුදල් ප්‍රතිපාදනයක් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.52,531,163 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව මූලධන වියදමෙන් සියයට 71ක් ඉතිරි වී තිබුණි.	සිවිල් වැඩ සම්බන්ධයෙන් තාක්ෂණික දැනුම සහිත නිලධාරියෙකු නොමැති වීම, පවතින භාණ්ඩ අලුත්වැඩියා කර භාවිත කිරීම, සියලු අවශ්‍යතා සමාලෝචනය කර එකවර ප්‍රසම්පාදනය කිරීමෙන් පිරිවැය අඩු කර ගැනීම හා පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයින්ගේ සහභාගීත්වය ලබාගැනීමට නොහැකි වීම වැනි හේතු මත මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව.	හැකිතාක් දුරට නිවැරදිව ඇස්තමේන්තු උචිත පරිදි පිළියෙල කළ යුතුය.
(ආ)	මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, තම දෙපාර්තමේන්තුවට අදාළ කෙටුම්පත් ඇස්තමේන්තු, මුදල් රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කරන බවට වගබලා ගැනීම ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රතිපාදන සලසා තිබූ	මාසික ජීවන වියදම් දීමනාව ඉහළ දැමීම, අනපේක්ෂිත ලෙස විදේශයන්හි පැවති ජාත්‍යන්තර සමුළුවල මාධ්‍ය ආවරණයන් සඳහා නිලධාරීන් සහභාගී කරවීමට සිදු වීම, විදේශ පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් සහභාගී කරවීම, ආරක්ෂක සේවා හා පිරිසිදු කිරීමේ සේවා සඳහා	ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල කළ යුතුය.

සමස්ත පුනරාවර්තන වැය විෂයයන් 22 කින් පුනරාවර්තන වැය විෂයයන් 08 කට සලසා තිබුණු රු. 26,534,060 ක ප්‍රතිපාදන වෙනත් පුනරාවර්තන වැය විෂයයන් 05 ක් සහ මූලධන වැය විෂයයක් වෙත මාරු කර තිබූ බැවින් මුදල් රෙගුලාසිවල අවශ්‍යතා සපුරාලන පරිදි කටයුතු කරමින් තාත්විකව ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	වාර්ෂික අයවැයෙන් වෙන් වී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, වාහන වසර 10 කට වඩා පැරණි බැවින් ඒවායේ නඩත්තු වියදම් ඉහළ යාම හා මෘදුකාංග නඩත්තුව සඳහා අයවැයෙන් වෙන් වූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙනත් වැය විෂයන්ගෙන් ප්‍රතිපාදන මාරු කරගෙන ඇති බව.	

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව නිරවුල් නොකළ බැදීම් හා බැරකම් රු.9,484,680 ක් වූ අතර බැරකම් ලේඛනයේ බැදීම් හා බැරකම් රු. 10,510,212 ක් වූයෙන් රු.1,025,532 ක වෙනසක් නිරීක්ෂණය විය.	CIGAS පද්ධතිය තුල බැදීම් ඇතුළත් කිරීමට නොහැකි බැවින් එම බැදීම් සියල්ල බැරකම් ලෙස දක්වා ඇති බව.	බැරකම් ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු අතර මූල්‍ය ප්‍රකාශනවල හා බැරකම් ලේඛනයේ බැරකම් නිවැරදිව සටහන් කළ යුතුය.
(ආ)	මු.රෙ. 94 (i) ප්‍රකාරව වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැදීමකට හෝ නොබැදී සිටිය යුතුය. එසේම ඒ වෙනුවෙන් දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටෙක මුදල් වර්ෂයේ ප්‍රතිපාදන නොඉක්ම විය යුතු වුවත් 2024 වර්ෂයේ දී පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා රු.1,041,633ක් ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි.	ඇතැම් වැය විෂයන්ගේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ බැවින් එම වැය විෂයන්ට අදාළ බැරකම්, බැරකම් ලේඛනයේ ඇතුළත් කර තිබූ බව හා CIGAS පද්ධතියට ඇතුළත් කළ නොහැකි බැවින් රු. 1,025,532ක බැරකම් වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කිරීමට නොහැකි වූ බව.	ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොඑළඹිය යුතුය.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**				
	මු.රෙ.104	-	දෙපාර්තමේන්තුවට අයත් වාහන 02 ක් 2024 වර්ෂය තුළදී අනතුරකට ලක්වී තිබූ අතර මෙම අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිවයුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කර නොතිබුණි.	වාහන සම්බන්ධව අධිකරණ ක්‍රියා මාර්ග ගෙන තිබූ බැවින් 2024 වසර අවසන් වීමට පෙර අභ්‍යන්තර පරීක්ෂණය අවසන් කිරීමට නොහැකි වූ බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
	මු.රෙ. 802	-	වාහන නිශ්කාර්යව නොපවතින බවට ආයතන ප්‍රධානියා විසින් වගබලා ගැනිම ට පියවර ගතයුතු වුවද දෙපාර්තමේන්තුව සතු වාහනයක් 2023 වර්ෂයේ සිට විගණිත වාර්තාවේ දින දක්වා නිශ්කාර්යව පැවතුණි.	GB-4070 දරණ වාහනය අලුත්වැඩි -යා කළ යුතු බවත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා අලුත්වැඩියා සිදු නොකරන ලද බව.	වාහනය අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුය.
(ii)	2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය	-	වාර්ෂික කාර්යසාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස් කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා නියමිත විධිවිධාන යටතේ	2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2025 මැයි මස පාර්ලිමේන්තුව ට ඉදිරිපත් කිරීමට නියමිත බව.	චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තා නියමිත පරිදි

		පාර්ලිමේන් තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්ත-මේන්තුවේ 2019, 2020 හා 2021 වර්ෂ වලට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තා 2023 ජූලි 26 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණු අතර 2022 වර්ෂයට අදාළ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2025 මාර්තු 31 දින වන විටත් පාර්ලිමේ-න්තුවට ඉදිරිපත් කර නොතිබුණි.	පාර්ලිමේන්තු වට ඉදිරිපත් කළ යුතුය

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ක්‍රියාකාරී සැලැස්මට අනුව කිසිදු භෞතික ප්‍රගතියක් නොමැති වැඩසටහන් 12ක් පැවති අතර ඉන් රු. මිලියන 41.33ක් ප්‍රතිපාදන සලසා තිබූ වැඩසටහන් 08ක් පැවතිය ද එම මූල්‍යමය ප්‍රතිපාදන වර්ෂය තුළ අදාල වැඩසටහන් සඳහා යොදවා නොතිබුණි.	මාධ්‍ය උපමානවලට යටත්ව ඇතැම් වැඩසටහන් ක්‍රියාත්මක කරනු නොලැබුණු බවත්, තවත් කිහිපයක් තාවකාලිකව නතර කරන ලද බවත් අනෙක් ක්‍රියාකාරකම් කිහිපය ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බවත් දන්වා ඇත.	වර්ෂය තුළ ඉටු කිරීමට සැලසුම් කළ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන යොදා ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයට අදාලව පිලියෙළ කල ක්‍රියාකාරී සැලැස්මට අනුව වර්ෂයේ කාර්ය සාධන ප්‍රගතිය සැලකීමේදී සියයට 50 ට වඩා අඩු ප්‍රගතියක් පෙන්නුම් කරන වැඩසටහන් 05ක් පැවතුණි.	ක්‍රියාකාරකම් 05ක් පමණක් ඇති බව.	සැලසුම් කළ ආකාරයට කාර්ය සාධනය ළඟා කර ගත යුතුය.

4.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ආයතනයේ අභ්‍යන්තර සන්නි- වේදන කටයුතු සිදු කිරීමට අත්‍යවශ්‍ය වන PABX පද්ධතිය ස්ථාපිත කිරීමේ කටයුතු 2023 වර්ෂයේ ආරම්භ කර ඇති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිම කර නොතිබුණි.	මූලික අදියරේ කටයුතු සිදු කිරීම නිසා මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය සියයට 30 ක් ලෙස දක්වා ඇති බව.	සැලසුම් කළ කාර්යයන් නියමිත කාලය තුළ ඉටු කළ යුතුය.

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂය තුළ මිල දී ගත් රු. 5,103,500 වටිනාකමින් යුත් ලැප්ටොප් පරිගණක 04 ක් හා ඩෙක්ස්ටොප් පරිගණක 11ක් 2024 දෙසැම්බර් 31 දින පෞද්ගලික සමාගමකින් මිල දී ගෙන තිබූ අතර එම පරිගණක අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවූ බැවින් 2025 මාර්තු 31 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි.	පරිගණක භාර ගැනීමේදී අඩුපාඩු ඇති බව නිරීක්ෂණය වූ බවත් 2025 අප්‍රේල් 03 එම අඩුපාඩු සකස් කරදීමෙන් පසු දිස්ත්‍රික් කාර්යාල වෙත එම පරිගණක බෙදා හැරීමට කටයුතු කරමින් පවතින බව.	නියමිත පිරිවිතරයන්ට අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතු අතර නොපමාව අදාළ වත්කම් උපයෝජනයට කටයුතු කළ යුතුය.

4.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු	2024 වර්ෂය සඳහා පමණක් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇති බව.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ යුතුය.

	ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළයුතු අතර වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කළ යුතුය. දෙපාර්තමේන්තුව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම 2024 වර්ෂය සඳහා පමණක් සකස් කළ එකක් විය.		
(ආ)	සමාලෝචිත වර්ෂය සඳහා ලැප්ටොප් පරිගණක 15ක් පමණක් ලබා ගැනීමේ අවශ්‍යතාව දක්වමින් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර තිබූ නමුත් පසුව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලීය අවශ්‍යතා ලෙස දක්වමින් රු.9,877,779 ක වටිනාකමින් යුතු ලැප්ටොප් පරිගණක 17ක් හා ඩෙක්ස්ටොප් පරිගණක 12ක් මිලට ගෙන තිබුණි.	අළුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ තිබූ පරිගණක සඳහා නව Laptop පරිගණක ලබා දීමට කටයුතු කළ බවත් වසර 5 දේශීය/විදේශීය නිවාඩු ලබා නැවත එම නිවාඩු කාලය කලින් අවසන් කොට සේවයට වාර්තා කළ නිලධාරීන්ද කිහිපදෙනෙකු සිටීම අදාළ පරිගණක අවශ්‍යතාවය වැඩිවීමට හේතු වී ඇති බව.	අවශ්‍යතා නිවැරදිව හඳුනාගත යුතු අතර ප්‍රසම්පාදන සැලසුමට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදු කළ යුතුය.
(ඇ)	අංක 01/2024 හා 2024 ජනවාරි 10 දිනැති ජාතික අය වැය චක්‍රලේඛ ප්‍රකාරව හදිසි මිල දී ගැනීම් සිදු නොවන පරිදි අවශ්‍යතා කලින් හඳුනා ගැනීම හා අනුමත ප්‍රසම්පාදන සැලසුම් ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාදයන් අවම වන පරිදි ක්‍රියාත්මක කළ යුතු වුවත් පරිගණක මිලට ගැනීමේ අවශ්‍යතාව සම්බන්ධ තීරණ ගැනීම සිදු කර ඇත්තේ 2024 නොවැම්බර් මස 26 වැනි දින වන අතර ආයතනික අවශ්‍යතා කලින් තීරණය කර ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට ක්‍රියා කර නොතිබුණි. 2024 වර්ෂයේ අදාළ සංශෝධන ඇතුළත් කරමින් සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්ම සකස්	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනයට අනුමැතිය ලැබී ඇත්තේ 2024 දෙසැම්බර් 30 දින බැවින් ප්‍රසම්පාදන සැලැස්ම සංශෝධනය කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වූ බව.	අවශ්‍යතා නිවැරදිව හඳුනාගත යුතු අතර ප්‍රසම්පාදන සැලසුමට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදු කළ යුතුය.

	කිරීමට ද කටයුතු කර නොතිබුණි.		
(ඇ)	ආයතනයේ පුස්තකාල කළමනාකරණ පද්ධතිය, මානව සම්පත් කළමනා - කරණ තොරතුරු පද්ධති - ය, වැඩ ප්‍රවාහ සහ තැපැල් කළමනාකරණ පද්ධතිය (Work Flow and Postal management System) ස්ථාපිත කිරීම සඳහා රු. 1, 633,781ක් වැය කර තිබූ අතර ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මගින් ඉහත කාර්යය ඉටු කරගෙන තිබුණි. ආයතනයේ ස්වභාවයට ගැළපෙන පරිදි අදාළ පද්ධතීන්වල අවශ්‍යතාවයන් නිශ්චිතව හඳුනාගෙන නොතිබුණි. මේ සම්බන්ධව 2024 ඔක්තෝබර් 07 දිනැති රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් තාක්ෂණික කමිටුවක් පත් කර තිබුණ ද එම කමිටුව සුදුසුකම් සහ පළපුරුද්ද සහිත නිලධාරීන්ගෙන් සමන්විත නොවූ බව නිරීක්ෂණය විය.	මානව සම්පත් කළමනාකරන පද්ධතිය, Work flow and Postal Management System සහ පුස්තකාල කළමනාකරන පද්ධතිය සංවර්ධනයේදී, ඍජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ සම්පාදනය සිදු කිරීමේදී ප්‍රසම්පාදන කමිටුවේ අධිකාර සීමාවන් ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහය සංශෝධනයන් ලෙස 2024 ජුනි 25 දින නිකුත් කර ඇති අතර එය Supplement 40 හි සඳහන්ව ඇති බැවින් ඒ අනුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් මෙම ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබාදීමට කටයුතු කර ඇති බව.	දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයන්ට ගැළපෙන පරිදි ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු අතර, තාක්ෂණික ඇගයීම් කමිටු පත් කිරීමේ දී සුදුසුකම් හා පළපුරුද්ද සහිත නිලධාරීන් පත් කිරීමට කටයුතු කළ යුතුය.

4.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	රජයේ ප්‍රවෘත්ති දෙපාර්ත- මේන්තුව පිහිටි අක්කර 2 රූඩ් 2 පර්චස් 9.25ක භූමියේ වටිනාකම රු. 1,227,750,000 ලෙස තක්සේරු කර 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ඇතත් එහි අයිතිය	ඉදිරියේදී කටයුතු කිරීමට සටහන් කර ගත් බව.	ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

	දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කර නොතිබුණි. ඉඩමේ වටිනාකම මුළු වත්කම්වලින් සියයට 63 ක් නියෝජනය වේ.		
(ආ)	1999 වර්ෂයේ දී ප්‍රංශ ණය ආධාර යටතේ මිලදී ගෙන තාක්ෂණික ක්‍රමවේදයන් යල්පැනීම හේතුවෙන් භාවිතයට නොගෙන නිශ්කාර්යව පවතින අනාගත ආර්ථික ප්‍රතිලාභයක් නොමැති Debri වර්ණ රසායනාගාර යන්ත්‍රය රු.12,000,000 ක වටිනාකමට මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති අතර සුන්බුන් අගය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට මේ වන තෙක් කටයුතු කර නොතිබුණි.	ප්‍රංශ ණය ආධාර යටතේ මිලදී ගෙන ඇති Debri වර්ණ සංයෝජන යන්ත්‍රය එවකට පැවති විනිමය අනුපාතිකය අනුව රු. මිලියන 160ක පමණ වටිනාකමක් වන බවත්, එහි පිරිවැය තක්සේරු කර ගිණුම්ගත කර තිබෙනුයේ රු. මිලියන 12ක වටිනාකමකට බවත්, එම අගය යන්ත්‍රයේ වටිනාකමින් සියයට 7.5 ක පමණ සුළු වටිනාකමක් බවත්, මෙම යන්ත්‍රය සඳහා වන ණය මුදල ගෙවා අවසන් වීමට නියමිතව ඇත්තේ 2042 වර්ෂය වන විට බවත් දන්වා ඇත.	සුන්බුන් අගය හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

4.6 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
මුදල් රෙගුලාසි 880 ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වන අධිකාරිය අනුව ඇප තැබිය යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ඇප තැබිය යුතු නිලධාරීන් සිව්දෙනෙකු ඇප තබා නොතිබුණි	මුදල් රෙගුලාසි හා අදාළ ආඥා පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය	2025 ජුනි මස සිට ඇප සඳහා අය කර ගැනීමට කටයුතු කරමින් පවතින බව

4.7 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උතුරු දුම්රිය මාර්ගය නවීකරණය පිළිබඳව වාර්තා වැඩසටහනක් රු.239,481 ක් වැයකර නිෂ්පාදනය කර තිබුණු නමුත් මේ දක්වා කිසිදු මාධ්‍ය ජාලයක විකාශනය කර නොතිබුණි. අදාල වැඩසටහන විනාඩි 05කට නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද විනාඩි 30 කට නිෂ්පාදනය කර තිබුණි.	වාර්තා වැඩසටහන මෙතෙක් ප්‍රචාරය කිරීමට නොහැකි වී ඇති බවත්, මෙම වාර්තා වැඩසටහනේ ධාවන කාලය විනාඩි 15 ඉක්මවා ගොස් ඇති බවත්, මෙහි ධාවන කාලය වැඩි වුවද පළමු අදියර සඳහා ඇස්තමේන්තු කළ මුදල ඉක්මවා අමතර කිසිදු වියදමක් දරා නොමැති බව.	අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි ක්‍රියා කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රජය සහ නිල ණය දෙන්නන්ගේ කමිටුව සමග ප්‍රංශයේ පැරිස් නුවර 2024 ජුනි මස 26 සිට 29 දක්වා වන කාල සීමාව තුළ දී අත්සන් කෙරුණු ගිවිසුමේ මාධ්‍ය ආවරණ කටයුතු සිදු කිරීම පිණිස විදේශගත වීම සඳහා නියමිත දිනට වීසා ලබා නොගැනීම හේතුවෙන් ගුවන් ගමන් බලපත්‍රවල දිනයන් කල් දැමීමට සිදුව ඇති නිසා ඒ වෙනුවෙන් රු.169,200 ක දඩ මුදලක් ගෙවීමට සිදුව තිබූ අතර මාධ්‍ය කණ්ඩායම ප්‍රංශයට යන විටත් අදාළ ගිවිසුම අත්සන් කර අවසන් බව නිරීක්ෂණය වූ බැවින් මේ සඳහා දැරූ 1,804,421ක මුදල නිශ්කාර්ය වියදමක් බව විගණනයේ දී නිරීක්ෂණය විය.	මෙම කාර්යය සඳහා වීසා ප්‍රමාද වීම මත ජුනි 26 දිනට අදාළ කාර්යයන් සඳහා එම රටෙහිදී සම්බන්ධ විය නොහැකි වුවත්, 2024 ජුනි 26 දින රාත්‍රියේ දී මෙම නිලධාරීන් පිටත්ව ගොස් 2024 ජුනි 27 පෙරවරුවේ ප්‍රංශයේ පැරිස් නුවරට ගොස් එදින සිට අදාළ රාජකාරී ඉටු කර ඇති බව.	අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි ක්‍රියා කළ යුතුය.

4.8 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 වර්ෂයේ දෙසතිය සඟරාවේ මුද්‍රණ හා කතෘ පිරිවැය රු. 3,299,994 ක් වු අතර විකුණුම් ආදායම රු. 772,339 ක් විය. ඒ අනුව රු. 2,527,655 ක අලාභයක් ලබා තිබුණි.අලාභය අවම වන පරිදි පිරිවැය ආවරණය කරගත හැකි ආකාරයේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතර මුද්‍රණය කරන කලාප වශයෙන් විකුණුම් ආදායම වෙන්ව හඳුනා ගැනීමට වැඩ පිළිවෙලක්ද සකස් කර නොතිබුණි.	මෙය ආරම්භක අවධියේ හුදෙක් ජාතික කාර්යභාරය ඉටු කිරීමක් විනා අලෙවිය මත පදනම් වූ කාර්යයක් නොවන බවත්, මාණ්ඩලික නිලධාරී රැස්වීම් තීරණයකට අනුව එහි පිටපත් සංඛ්‍යාව 2024 වසරේ මැයි මස සිට 500 දක්වා අඩු කර ඇති බවත්, දෙසතිය පුවත් සඟරාව මසකට එක් කලාපයකට සීමා කිරීමට සිදු වූ බවත් දන්වා ඇත.	විකුණුම් අදායම නිවැරදිව හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කළ යුතු අතර පිරිවැය අවම කර ගැනීමත් අවම වශයෙන් පිරිවැය ආවරණය කර ගැනීමට හැකි වැඩපිළිවෙලක් සකස් කිරීමත් කළ යුතුය.
(ආ)	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ නව ශ්‍රවණාගාරයට විදුලි ජනන යන්ත්‍රයක් කුලී පදනම මත ලබා ගැනිම 2022 වර්ෂයේ සිට සිදුකර තිබූ අතර ඒ සඳහා 2024 වර්ෂය සඳහා පමණක් රු.1,206,703 ක කුලී වියදමක් දරා තිබුණි. ජාතික වශයෙන් වැදගත් වන්නා වූ රජයේ ප්‍රතිපත්ති සැලසුම් හා සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳව දැනුවත් කිරිම අඛණ්ඩව සිදු කිරීම සඳහා ආයතනය තුළම නිරන්තරවම විදුලි ජනන යන්ත්‍රයක් පැවතීම අත්‍යාවශ්‍ය බව නිරීක්ෂණය විය. 2024 වර්ෂයේ යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීමට රු.100,300,000 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2024 විදුලි ජනන	2024 වර්ෂය තුළ නව යන්ත්‍රයක් මිල දී ගැනීමට නොහැකි වී ඇති බව.	අවශ්‍යතාවයට අනුකූලවන පරිදි අත්‍යාවශ්‍ය ප්‍රසම්පාදනයන් සැලසුම් කර මිල දී ගැනීමට කටයුතු කළ යුතුය.

	යන්ත්‍රයක අවශ්‍යතාව ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් කිරීමට ක්‍රියාකර නොතිබුණි.		
(ඇ)	පෞද්ගලික සමාගමකින් මිලට ගත් පරිගණක 15 වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා අංක 312329 හා 2024 දෙසැම්බර් 29 දිනැති චෙක්පත සකස් කර 2025 මාර්තු 31 දින දක්වා අදාළ පාර්ශවය වෙත භාර නොදී ගිණුම් අංශය තුළ රඳවා ගෙන තිබුණි. 2024 දෙසැම්බර් 31 දින දෙපාර්තමේන්තු ගබඩාවට අදාළ පරිගණක ලැබී තිබූ බව ප්‍රසම්පාදන ලිපිගොනුව අනුව නිරීක්ෂණය වූ අතර අදාළ පරිගණක ගබඩා වෙත ලැබීමට පෙර අදාළ චෙක්පත ලියා ඇති බව නිරීක්ෂණය විය.අදාළ පරිගණකවල අඩුපාඩු පවතින බව අංශ ප්‍රධානි, ඩිජිටල් හා තොරතුරු තාක්ෂණ ඒකකය විසින් 2024 දෙසැම්බර් 31 දින ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී වෙත ලිඛිතව දන්වා ඇතත් ඒ බව මිල දී ගත් සමාගමේ විකුණුම් කළමනාකරු වෙත ලිඛිතව දැනුම් දීම සිදු කර තිබුණේ 2025 මාර්තු 20 දින දීය.	2024 වර්ෂයේ ගිණුම් පියවිය යුතු බැවින් 2024 දෙසැම්බර් 29 දින චෙක්පතක් ලියා එම වියදමට අදාළව මුදල් වෙන්කර ගන්නා ලද බවත්, පරිගණක වල සුළු අඩුපාඩු කිහිපයක් නිරීක්ෂණය වූ බැවින් චෙක්පත් පසුව නිකුත් කිරීමට කටයුතු කරන ලද බවත්, අඩුපාඩු පිළිබඳව අදාළ ආයතනයේ නිලධාරීන්ට වාචිකව කිහිප වරක් දැනුම් දුන් බවත්, එය ඉක්මනින් ඉටු නොවූ බැවින් 2025 මාර්තු 20 දින ලිඛිතව දැනුම් දෙන ලද බවත්, පිරිවිතරයන්ට අනුව 2025 අප්‍රේල් 04 දින පරිගණක උපකරණ ලැබී ඇති අතර, චෙක්පත එම ආයතනය වෙත නිදහස් කර ඇති බවත් දන්වා ඇත.	නියමිත පිරිවිතරයන්ට අනුව අදාළ භාණ්ඩ ලැබී ඇති බව සහතික කර ගැනීමෙන් අනතුරුව ගෙවීම් කටයුතු සිදුකළ යුතුය

5. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරණ ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනතෙහි භාවිතයට ගැනෙන නියෝග අනුව ආයතනය තිරසර අරමුණු හඳුනා ගැනීමේ දී අරමුණු	2025 වර්ෂයේ සිට ඉදිරියට තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීමේ දී එම කරුණු කෙරෙහි තවදුරටත් අවධානය යොමු කර ඇති බව.	ආයතනයේ විෂය පථයට හා මූල්‍යමය හැකියාවට ගැළපෙන පරිදි තිරසර අරමුණු ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය

06 ක් හඳුනාගෙන තිබුණ ද ඉලක්ක සපුරා ගැනීමේ අභියෝග ලෙස ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම හා කලින් කලට රජය විසින් විවිධ චක්‍රලේඛ මගින් ප්‍රතිපාදන සීමා කිරීම දක්වා ඇතත් ලැබෙන ප්‍රතිපාදන කාර්යක්ෂමව ඵලදායීව යොදාගෙන ආයතනයේ විෂය පථයට හා මූල්‍යමය හැකියාවට ගැළපෙන පරිදි තිරසර අරමුණු ස්ථාපිත කිරීමට කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.		

6. යහපාලනය

6.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව ක්ෂේත්‍ර 12කට අදාලව අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට සැලසුම් කර තිබුණද එයින් ක්ෂේත්‍ර 07ක් සම්බන්ධව අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි	අංශයෙහි රාජකාරි ඉටු කිරීමේදී දුෂ්කරතාවලට මුහුණ දීමට සිදු වීම හේතුවෙන් 2024 අභ්‍යන්තර විගණන සැලැස්මෙහි ඉලක්ක කරා ළඟා වීමට අපහසු වූ බවත් 2025 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව කටයුතු කරන බව.	අදාළ වර්ෂය තුළ සැලසුම් කළ පරිදි අභ්‍යන්තර විගණන කටයුතු සිදු කළ යුතුය.

7. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ කාර්ය භාරය විධිමත් රාජකාරී පැවරුම් ලැයිස්තුවක් මගින් හෝ පනතක් /ගැසට් නිවේදනයක් මගින් බලාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.	රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික ලිපිගොනු හා ඒ සම්බන්ධ කටයුතු පාලනය කරනු ලබන්නේ සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මගින් වන බැවින් මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු අමාත්‍යාංශයෙන් විමසීමට ඉදිරියේ දී කටයුතු කරන බව.	විධිමත් රාජකාරී පැවරුම් ලැයිස්තුවක් මගින් හෝ පනතක් /ගැසට් නිවේදනයක් මගින් බලාත්මක කිරීමට කටයුතු කළ යුතුය
(ආ)	2022 වසරේ සංවර්ධන නිලධාරී සේවයේ නව පත්වීම් ලබා දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටින සංවර්ධන නිලධාරීන් 63 දෙනෙක්ද ඊට අමතරව ප්‍රවෘත්ති නිලධාරී තනතුරු 24ක්, මාධ්‍ය විමර්ශන සහකාර තනතුරු 11ක්, වෙබ් ලේඛක තනතුරු 04ක්ද ඇතුළුව තනතුරු 102ක් දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොකර ආයතනයේ සේවය කරන බව නිරීක්ෂණය විය.	අනුයුක්ත කළ සංවර්ධන නිලධාරීන් මෙම දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට අදාළව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා තොරතුරු යවා ඇති බවත්,මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථානයෙන් මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කළ කාර්ය මණ්ඩලයට අදාළ අනෙක් තනතුරුවල නිලධාරීන් සම්බන්ධයෙන් නිර්දේශ ලබා ගැනීමට කමිටුවක් පත් කර ඇති බවත් කමිටු නිර්දේශය ලද පසු රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත ඉදිරි කටයුතු සිදු කරනු ලබන බවත් දන්වා ඇත.	දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය නිවැරදිව සකස් කර ගැනීමට අවශ්‍ය කටයුතු නොපමාව සිදු කළ යුතුය.

(ඇ)	දෙපාර්තමේන්තුව තුළ වර්ෂ 5 ඉක්මවා සේවයේ නියුතු 68 දෙනාගෙන් 13 දෙනෙකු වසර 11ත් 15ත් අතර වර්ෂ ගණනකුත්, 30 දෙනෙකු අවුරුදු 15කට වැඩි වර්ෂ ගණනකුත් දෙපාර්තමේන්තුවේ සේවය කර ඇති බව නිරීක්ෂණය විය.	වසර 2005දී බඳවා ගත් සංවර්ධන නිලධාරී උපාධිධාරීන් මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රවෘත්ති නිලධාරී තනතුරට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කිරීම මත එම කටයුතු සිදු වන බැවින් ලබා දී ඇති උපදෙස් මත එම නිලධාරීන්ගේ සේවා කාලය මත ස්ථාන මාරු සඳහා තොරතුරු ඉදිරිපත් නොකරන ලද බව.	වර්ෂ 5 ඉක්මවා සේවයේ නියුතු නිලධාරීන්ට ස්ථාන මාරු වීම් ලබා දීමට කටයුතු කළ යුතුය